# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2015 මාර්තු මස 27 වන දින

## II වන කොටස

## අතිරේකය

(2015. 03. 30 දින නිකුත් කරන ලදී)

# විදුලි සංදේශ බදු (සංශෝධන)

**2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

මුදල් අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 6.00. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය :*** 2014 අංක 11 දරන පනතින් අවසන්වරට සංශෝධිත (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනතේ 2 වන වගන්තිය මේ වගන්තිය මගින් සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ ක්‍රියාකරුවන් විසින් සපයන හෝ පෙරගෙවුම් සේවාවන් මත අවස්ථාවෝචිත පරිදි ක්‍රියාකරු මත හෝ ග්‍රාහකයා මත බද්දක් පැනවීම සහ බදු අයකරනු ලබන කාලසීමාව, 2015 අප්‍රේල් මස 1 වන දා සිට ව්‍යාප්ත කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***3 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 2අ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් බදු ගෙවීම සඳහා වන දිනය හෝ කාල සීමාව අමාත්‍යවරයා විසින් නියමයක් මගින් නිශ්චිතව දැක්වීම පිණිස විධිවිධාන සැලැස්වීම වේ.

***4 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ පෙර ගෙවුම් සේවාවන් වෙනුවෙන් ක්‍රියාකරු විසින් ගෙවන ලද සම්ප්‍රේෂණය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

එල්.ඩී.—ඕ. 15/2015

**2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

**1.** මේ පනත 2015 අංක  දරන විදුලි සංදේශ බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර 2015 අප්‍රේල් මස 1 වන දින සිට ක්‍රියාත්මකවිය යුතු ය.

2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනතේ 2වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** 2014 අංක 11 පනත මගින් අවසන් වරට සංශෝධිත (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනතේ 2 වන වගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය වැඩි දුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"2 (1) (මෙහි මින්මතු "ග්‍රාහකයා" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් විදුලි සංදේශ සේවාවක් ග්‍රහණය කරන සෑම තැනැත්තකුගෙන් ම-

(අ) 2011 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන එහෙත් 2013 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව වූ කාලය සඳහා සියයට විස්සක් වූ අනුප්‍රමාණයකින් ද;

(ආ) 2013 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන එහෙත් 2014 ජනවාරි මස 1 වන දිනයට පෙරාතුව වූ කාලය සඳහා-

(i) අන්තර්ජාල සේවා සැපයුම් අගය මත සියයට දහයක් වූ අනුප්‍රමාණයකින්; සහ

(ii) අන්තර්ජාල සේවා සැපයීම නොවන විදුලි සංදේශ සේවා සැපයුම් අගය මත සියයට විස්සක් වූ අනුප්‍රමාණයකින් ද;

(ඇ) 2014 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන එහෙත් 2015 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව වූ කාලය සඳහා—

2—PL 008876—450 (2015/03)

(i) අන්තර්ජාල සේවා සැපයුම් අගය මත සියයට දහයක් වූ අනුප්‍රමාණයකින් ; සහ

(ii) අන්තර්ජාල සේවා සැපයීම් නොවන විදුලි සංදේශ සේවා සැපයුම් අගය මත සියයට විසිපහක අනුප්‍රමාණයකින් ද;

(ඇ) 2015 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් කාලයක් සඳහා-

(i) පෙරගෙවුම් සහ පසුගෙවුම් යන සේවා දෙක සඳහා, අන්තර්ජාල සේවා සැපයුම් අගය මත සියයට දහයක් වූ අනුප්‍රමාණයකින්; සහ

(ii) පසු ගෙවුම් සේවා සඳහා, අන්තර්ජාල සේවා සැපයීම් නොවන විදුලි සංදේශ සේවා සැපයුම් අගය මත සියයට විසිපහක අනුප්‍රමාණයකින් ද;

(මෙහි මින්මතු"බද්ද''යනුවෙන් හඳුන්වනු ලබන) විදුලි සංදේශ බද්ද යනුවෙන් හඳුන්වනු ලබන බද්දක් එක් එක් මාසය සම්බන්ධයෙන් එම විදුලි සංදේශ සේවා ලැබීමේ දී ක්‍රියාකරු විසින් සපයනු ලබන විදුලි සංදේශ සේවා සැපයුමේ අගය මත පනවා අයකර ගනු ලැබිය යුතු ය.

(2) පෙර ගෙවුම් සේවාවක් ලෙසින් යම් ග්‍රාහකයකුට අන්තර්ජාල සේවා සැපයීම් නොවන විදුලි සංදේශ සේවා සපයන සෑම ක්‍රියාකරුවකුගෙන් ම 2015 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන, 2අ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් දිනයක් හෝ කාලසීමාවක් දක්වා වන යම් කාලයක් සඳහා වන පරිදි (1) වන උපවගන්තියේ සඳහන් බද්දක්, එම විදුලි සංදේශ සේවා සැපයුමේ අගයමත සියයට විසිපහක අනුප්‍රමාණයකින්, පනවා, අය කරගනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ කාර්යය සඳහා, යම් එවැනි දිනයක් හෝ කාල සීමාවක් නිශ්චිතව දක්වනු ලැබූ විට, අමාත්‍යවරයා විසින් නිශ්චිතව දක්වනු ලබන ඒ දිනයේ හෝ කාලසීමාවේ සිට බලාත්මකවන පරිදි, අන්තර්ජාල සේවා සැපයීම් නොවන පෙරගෙවුම් සේවා වශයෙන් විදුලි සංදේශ සේවාවක් ලබන සෑම ග්‍රාහකයෙකුගෙන් ම එම බද්ද අයකරගනු ලැබිය යුතු ය.

(4) (1) වන, (2) වන සහ (3) වන උපවගන්තිවල සඳහන් විධිවිධාන, 1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනතේ විධිවිධාන අදාළවන කිසිම සංවිධානයක් හෝ පුද්ගලයකු සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියට 2අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 2අ වගන්තිය ලෙස බලපවත් වන්නේ ය:—

"අමාත්‍යවරයා විසින් බදු ගෙවන දිනය හෝ කාල සීමාව නිශ්චිතව දක්වනු ලැබිය හැකිබව.

2අ. (1) 2 වන වගන්තියේ (2) වන උප වගන්තියේ සඳහන් බදු ගෙවීමේ දිනය හෝ කාලසීමාව, අමාත්‍යවරයා විසින් කරනු ලබන නියමයක් මගින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන නියමයට අමාත්‍යවරයා අත්සන් තැබූවිට, ඒ නියමය ක්‍රියාත්මක වන්නේ ය.

(3) ඒ සෑම නියමයක්ම හැකිතාක් ඉක්මනින් ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

(4) ඒ සෑම නියමයක් ම ඉන් පසුව, පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින්, හැකිතාක් ඉක්මනින් අනුමත කරනු ලැබිය යුතු ය.

(5) එවැනි යම් නියමයක් එසේ පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු නොලැබූ අවස්ථාවක, ඒ යෝජනා සම්මතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැළකිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"3. 2(1) වන වගන්තිය යටතේ එකතු කළ සහ 2 (2) වන වගන්තිය යටතේ ගෙවිය යුතු බදු මුදල්, 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17 වන වගන්තිය යටතේ බලයලත් ක්‍රියාකරුවන් විසින් (මෙහි මින්මතු

"කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට, කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් විස්තර ද සමග 2011 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන එක් එක් මාසය අවසානයේ පටන් දින පහළොවක් ඇතුළත, ප්‍රේෂණය කළ යුතු ය:

එසේ වුවද, 2014 මැයි මස 1 වන දින සිට බල පැවැත්වෙන පරිදි ඉන්වොයිසි නිකුත් කිරීමට පෙරාතුව හෝ ඉන්වොයිසි නිකුත් කිරීමකින් තොරව එම බද්ද අය කරන අවස්ථාවක, එම බද්ද —

(අ) යම් මාසයක පළමුවන 1 වන දිනයෙන් ආරම්භ ව එම මාසයේ පහළොස්වන දින දක්වා වන කාලය සඳහා එකතු කර ගනු ලබන විට, ඒ බදු මුදල් එම මාසයේ විසිවන වන දින හෝ එදිනට පෙරාතුව ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය; සහ

(ආ) යම් මාසයක දහසයවන දිනයෙන් ආරම්භ ව එම මාසයේ අවසානය දක්වා වන කාලය සඳහා එකතු කරගනු ලබන විට, පසුව එළඹෙන මාසයේ පස්වන දින හෝ එදිනට පෙරාතුව ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.".

වලංගු කිරීම.

**5.** 2015 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වී මේ පනත සම්බන්ධයෙන් කථානායකවරයාගේ සහතිකය ඔහුගේ අත්සන ඇතිව සටහන් කරනු ලබන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ දී, ක්‍රියාකරු විසින්, ප්‍රධාන ප්‍රඥප්තියේ 2 (1) (ඈ) වගන්තිය සහ 2 (2) වගන්තිය යටතේ අයකර, එකතුකර ගනු ලැබූ මුදල් සියලු කාර්යයන් සඳහා මේ පනත යටතේ වලංගු ලෙස පනවා, එකතු කරගනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ඉහත කී විධිවිධාන, එකී කාලසීමාව තුළ දී අයකරනු ලැබූ සහ එකතු කරනු ලැබූ එම මුදල් සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් නිකුත් කරන ලද යම් තීරණයකට හෝ ආඥාවකට හෝ යම් අධිකරණයක විභාග වෙමින් පවත්නා නීති කෘත්‍යකට බල නොපෑ යුතු ය.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**6.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.